**විශේෂ සටහන 9**

## කොවිඩ්-19 සහන සහ ණය පමා කාලයන්: අභියෝගයන් සහ ඉදිරි දැක්ම

### පසුගිය සියවසේ මානව වර්ගයා මුහුණ දුන් විශාලතම ආර්ථික අභියෝගය

කොවිඩ්19 යනු මෙම සියවසේ මානව වර්ගයා මුහුණ දුන් විශාලතම සෞඛ්‍ය හා ආර්ථික අභියෝගයයි. ලොව පුරා රටවල්වලින් සියයට 90කට වැඩි ප්‍රමාණයක් 2020 වසරේ දී ඔවුන්ගේ ආර්ථික ක්‍රියාකාරකම්වල සංකෝචනයන් වාර්තාකර ඇත. ගෝලීය ආර්ථිකයේ අන්තර්සබඳතා සහ එකිනෙකා මත රඳා පැවතීම හේතුවෙන්, මෙම ව්‍යසනය ලෝක ආර්ථිකයට පෙර නොවූ ලෙස බලපෑ අතර, මෙහි බලපෑම පළමු හා දෙවන ලෝක යුද්ධ, මහා ආර්ථික අවපාතය සහ ගෝලීය මූල්‍ය අර්බුදය යන ව්‍යසනයන් ද ඉක්මවිය (ලෝක බැංකුව, 2022).

### කොවිඩ්-19 සම්බන්ධයෙන් මහ බැංකු ප්‍රතිචාර දැක්වූයේ කෙසේද?

වසංගතයේ බහුවිධ අභියෝගවලට මුහුණ දීම සඳහා ලොව පුරා මහ බැංකු සහ මූල්‍ය අධිකාරීන් විසින් සාම්ප්‍රදායික සහ සාම්ප්‍රදායික නොවන ප්‍රතිපත්ති ප්‍රතිචාරයන් හඳුන්වා දෙන ලදී. මෙම පියවරයන්ට මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම, වත්කම් ප්‍රතිමිලදී ගැනීම/ප්‍රමාණාත්මක ලිහිල් කිරීම් වැඩසටහන්, සහ නියාමන ලිහිල් කිරීම් මෙන්ම රජයන් විසින් සපයනු ලබන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග යන් වන බදු අඩු කිරීම/කල් දැමීම, සෘජු මුදල් ගෙවීම්, ව්‍යාපාර නුබුන්වත්ව පවත්වා ගෙනයාම සඳහා පහසුකම් සැපයීම (insolvency support) සහ ගෙවීම් තාවකාලිකව අත්හිටුවීම/කල් දැමීම වැනි දෑ ඇතුලත් විය (ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, 2022).

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කොවිඩ්19 වසංගතයේ ආරම්භයත් සමඟ ආර්ථිකයට ද්‍රවශීලතාව සැපයීම සඳහා සුවිශේෂී ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මාලාවක් හඳුන්වා දුන් අතර, බලපත්‍රලාභී බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන (මෙතැන් සිට මූල්‍ය ආයතන, ලෙස හැඳින්වෙන) විසින් සිය ගනුදෙනුකරුවන්ට සහාය වීම සඳහා අවශ්‍ය මෙහෙයුම් නම්‍යශීලීත්වය සැලසීම සඳහා නියාමන ලිහිල්කිරීම් ද හඳුන්වා දෙන ලදී.

ඒ අනුව, වසංගතයෙන් පීඩාවට පත් ණය ගනුදෙනුකරුවන් විසින් ලබා ගන්නා ලද ණය සහ පොලී ගෙවීම සඳහා මාස හයක සහන කාලයක් ලබා දෙන ලෙසත්, එවැනි ණය සඳහා එකතු කර ඇති සහ නොගෙවූ දඩ පොලී කපා හරින ලෙසත් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය ආයතන වෙත දන්වන ලදී. පසුකාලීනව විවිධ අවස්ථාවන්හි දී කොවිඩ්19 වසංගත තත්ත්වයේ ඇතිවූ වර්ධනයන් සැලකිල්ලට ගනිමින්, දැඩි ලෙස පීඩාවට පත් වූ ණය ගනුදෙනුකරුවන් සඳහා මෙම ණය සහන කාල සීමාව ඒ ඒ අවස්ථාවන් හිදී මාස 18කට අධික කාලයක් සඳහා දීර්ඝ කිරීමට ද කටයුතු කරන ලදී.

මෙයට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක පාරිභෝගිකයන් සඳහා අඩු පොලී පිරිවැය අරමුදල් සැපයීම සඳහා රුපියල් බිලියන 50 ක ප්‍රතිමූල්‍යකරණ සහ ණය සුරැකුම් යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම, හඳුනාගත් ණය පහසුකම් සඳහා පොලී අනුපාතික අඩු කිරීම, ඉදිකිරීම් අංශයට සහ රජයේ සැපයුම්කරුවන්ට ද්‍රවශීලතා පහසුකම් සැපයීම, අක්‍රීය ණය ගනුදෙනුකරුවන්ට එරෙහිව ණය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග අත්හිටුවීම, සුළු පරිමාණ ගනුදෙනුකරුවන්ට සහන සැලසීම සඳහා බැංකු සේවා කිහිපයක ගාස්තු සහ අය කිරීම් අඩු කිරීම වැනි ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇත.

### කොවිඩ්-19 වසංගතය විසින් නිර්මාණය කරන ලද නව අභියෝග සහ අවස්ථා

කොවිඩ්19 නිසා ව්‍යාපාරයන්ට ඇති වූ බලපෑම ඒකාකාරී නොවන බව නොරහසකි. වසංගත තත්ත්වය මධ්‍යයේ සමහර ව්‍යාපාර සහ ආර්ථික අංශ මුළුමනින්ම ඇණහිටි අතර, ඇතැම් ව්‍යාපාර සිය ව්‍යාපාර වර්ධනය කරගැනීම සඳහා නව අවස්ථා සහ මංපෙත් සොයාගන්නා ලදී.

වසංගතයේ තත්ත්වයේ වැඩි වීමත් සමඟ ලොව පුරා ව්‍යාපාර රැසක් නිවසේ සිට රාජකාරී කිරීම සහ නම්‍යශීලී රාජකාරී ක්‍රම වෙත යොමු වූ අතර, එම ක්‍රමයන්ගේ ඇති බහුවිධ වාසි සහ අඩු පිරිවැය  හේතුවෙන් එය දැන් ස්ථිර වශයෙන් භාවිතයට යොමුවී ඇත. මෙලෙසම, බොහෝ ව්‍යාපාර විසින් ඔවුන්ගේ පිරිවැය අධික ව්‍යාපාරික ගමන් සහ සම්මුඛ රැස්වීම් වෙනුවට මංගත ක්‍රම ඔස්සේ පවත්වන සම්මන්ත්‍රණ සහ අතථ්‍ය රැස්වීම් වෙත යොමු වී ඇත. මෙවැනි අභිරුචිතාවයන් ගේ සිදුවූ වෙනස්වීම් නිසා ව්‍යාපාර විසින් තම යටිතල පහසුකම් භෞතික සහ අත්ථ්‍ය යන දෙවර්ගයේම සංකලනයක් ලෙස පවත්වා ගැනීමට ප්‍රමුඛතාවය ලබා දී ඇත (Sadun, Simcoe, සහ Conti, 202; Nugent, 2021) තවද, ඩිජිටල් සේවා සහ අන්තර්ජාල ගනුදෙනු සඳහා පාරිභෝගික නැඹුරුව වැඩිවීම නිසා සුපිරි වෙළඳසැල්, සිල්ලර වෙළඳාම්, විලාසිතා සහ විනොදාශ්වාද වැනි සේවා අංශයේ ව්‍යාපාර රැසක් තම ව්‍යාපාර කටයුතු ප්‍රධාන වශයෙන් මංගත සහ ස්මාට් ජංගම දුරකථන යෙදවුම් ඔස්සේ සිදු කිරීමට යොමු වන ලදී. දේශීය වශයෙන් ද, අන්තර්ජාල ඔස්සේ සිදු කෙරෙන සිල්ලර වෙළඳාම් ඉහළ යාම, වීඩියෝ චැනලින් සේවා ඔස්සේ වෛද්‍යවරුන් හමුවීම, මාර්ගගත ඉගෙනුම් සහ උපකාරක පන්ති සේවා සපයන්නන් සඳහා ඇති ඉල්ලුම ඉහළ යාම සහ සිනමා ශාලා, මංගල උත්සව, ප්‍රිය සම්භාෂණ, ප්‍රසංග, සංදර්ශන සහ සැනකෙළි ආදී

8

විශාල වශයෙන් ජනයා රැස්වෙන ක්‍රියාකාරකම් සඳහා අඩු නැඹුරුවක් දැක්වීම යනාදිය මගින් මෙම සන්දර්භය මැනවින් ප්‍රකට කරන ලදී. මෙවැනි වෙනස්කම් ඇතැම් ව්‍යාපාර සහ ඒ ආශ්‍රිත සැපයුම් දාම කෙරෙහි අයහපත් ලෙස බලපෑ අතර, ඇතැම් ව්‍යාපාර විසින් සිය ව්‍යාපාර නව්‍යකරණය සඳහා මෙම වෙනස්කම් නව අවස්ථාවන් බවට පරිවර්තනය කරගැනීමට කටයුතු කර ඇත.

මෙලෙසම, මූල්‍ය ආයතන සහ මූල්‍ය අංශය ද මෙම වසංගත තත්ත්වය හමුවේ බොහෝ අභියෝග සහ අවස්ථාවන්ට මුහුණ දෙන ලදී. වසංගත කාලය තුළ ලොව පුරා මූල්‍ය ආයතන මුහුණ දුන් වඩාත්ම තීරණාත්මක අභියෝගයන් ලෙස ද්‍රවශීලතා සහ ණය අවදානම් හැඳින්විය හැකි අතර, ඒනිසා හටගත් ආර්ථික කටයුතු අඩපණ වීම් හේතුවෙන් ව්‍යාපාර වසා දැමීම, රැකියා සහ ආදායම අහිමි වීම නිසා ණය ගැනුම්කරුවන්ට ඔවුන්ගේ ණය නිසි කලට ආපසු ගෙවීම වඩාත් දුෂ්කර විය. ගෝලීය ආර්ථිකයේ වැඩිවන අවිනිශ්චිතතාවය හේතුවෙන්, ක්‍රමිකව ණය ආපසු ගෙවූ ගනුදෙනුකරුවන්ගේ පවා පසුකාලීනව ණය පැහැර හැරීමේ සම්භාවිතාව සැලකිය යුතු ලෙස වැඩි විය. මෙමගින් මූල්‍ය ආයතනයන්හි වත්කම්වල ගුණාත්මකභාවයට සැලකිය යුතු බලපෑමක් එල්ල විය. ණය ගැතියන් විසින් ණය ආපසු ගෙවීම ප්‍රමාද කිරීම සහ තැන්පත්කරුවන් විසින් සිය තැන්පතු නිතර ආපසු ගැනීම නිසා මූල්‍ය ආයතනයන්හි ද්‍රවශීලතා තත්ත්වයන් ද බලපෑමට ලක් විය. මෙමගින් මූල්‍ය ආයතන හි ණය දීමට ඇති හැකියාව සීමා වූ අතර, එමගින් ආර්ථික ක්‍රියාකාරකම් නැවත යථා තත්ත්වයට පත්කිරීම සඳහා අවශ්‍ය ණය ප්‍රවාහ ද සීමා විය.

වැඩිවන අවිනිශ්චිතතාවය හේතුවෙන් මූල්‍ය ආයතන හි ණය දෙන්නන්, තැන්පත්කරුවන් සහ ආයෝජකයින් විසින් මූල්‍ය ආයතන වෙත වැඩියෙන් අරමුදල් යෙදවීමට මැලි කමක් දැක්වූ බැවින් නව අරමුදල් රැස්කිරීම සහ පවතින අරමුදල් මාර්ග ඉදිරි කාලය සඳහා දීර්ඝ කර ගැනීම මූල්‍ය ආයතන විසින් මුහුණ දුන් තවත් අභියෝගයක් විය. මේ නිසා මූල්‍ය ආයතන හි අරමුදල්වල පිරිවැය ඉහළ ගිය අතර ප්‍රතිමූල්‍යකරණ අවදානම ද වැඩි විය.

වසංගත තත්ත්වය විසින් මූල්‍ය ආයතනයන් හි මෙහෙයුම් අවදානම, සෞඛ්‍ය සහ ආරක්ෂණ අවදානම සහ ව්‍යාපාර අඛණ්ඩතා අවදානම වැනි අනෙකුත් අවදානම් ද වැඩි කළේය. සේවා සැපයීම් ඩිජිටල් ක්‍රම මත වැඩි වශයෙන් රඳා පැවතීම නිසා සයිබර් ආරක්ෂණ අවදානම සහ තාක්ෂණ අවදානම ඉහළ ගිය අතර, මෙවැනි නැගී එන අවදානම් තත්ත්වයන් අවම කිරීම සඳහා මූල්‍ය ආයතන හට වැඩි පිරිවැයක් දැරීමට ද සිදු විය. අවසානයේ දී, ඉහත සඳහන් සියළුම දෑ මූල්‍ය ආයතනයන් හි උපායමාර්ගික අවදානම ඉහළ දැමීමට හේතු විය. "නව සාමාන්‍යය" තුල මූල්‍ය ආයතන විසින් වසංගතයට පෙර සැලසුම් කළ උපායමාර්ග තවදුරටත් වලංගු නොවූ අතර, මූල්‍ය ආයතන හට ඔවුන්ගේ අවදානම් යලි තක්සේරු කිරීමට, ඔවුන්ගේ ප්‍රමුඛතා යලි පෙළගැස්වීමට සහ ඔවුන්ගේ ව්‍යාපාරික දිශානතීන් ගැන යලි විමසා බැලීමට සිදු විය.

කෙසේ වෙතත්, මංගත බැංකුකරණය, මුදල්රහිත ගෙවීම් සහ ඩිජිටල් පසුම්බි වැනි ඇතැම් ව්‍යාපාරික අංශයන් වසංගත කාලය තුළ ශීඝ්‍ර වර්ධනයක් අත්කර ගන්නා ලදී. පොදුවේ ගත් කල, ගෝලීය සහ දේශීය වශයෙන් අඩු වූ පොලී අනුපාතවලින් සහ විදේශ විනිමය අනුපාතිකයන්ගේ උච්ඡාවචනයන් හේතුවෙන් විදේශ මුදල් වත්කම්, වෙළඳපොළ අගයට ගැලපීමේ දී (mark-to-market) ඇති වන ලාභයන් නිසා මූල්‍ය ආයතන ලාභ උපයන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම ප්‍රවනතාවයන් සමීපව නිරීක්ෂණය කළ අතර, මූල්‍ය අංශයේ වැඩිවන අවදානම් විචක්ෂණශීලීව කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවන් වලදී කාලීන නියාමන ක්‍රියාමාර්ග හඳුන්වා දීමට කටයුතු කරන ලදී.

**සහනාධාර සහ ස්ථායීතාවය සමබර කරගන්නේ කෙසේ ද?**

ශ්‍රී ලංකා මහ බැංකුව, මෙරට ප්‍රමුඛතම මූල්‍ය අධිකාරිය ලෙස, සිය මූලික අරමුණු වන ආර්ථික සහ මිල ස්ථායිතාව සහ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව පවත්වා ගැනීමට අහිතකරව බලපෑ හැකි අනවශ්‍ය අවදානම් ගොඩ නැගීම වළක්වා ගනිමින්, බලපෑමට ලක් වූ ආර්ථික අංශ යලි යථා තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය සහන සැපයීමට කාලෝචිත ක්‍රියාමාර්ග ගන්නා ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වසංගත තත්ත්වය හමුවේ මුදල් ප්‍රවාහ කළමණාකරනය කරගැනීමේ දුෂ්කරතාවයන්ට මුහුණ දුන් ණය ගනුදෙනුකරුවන් හට, ඔවුන්ගේ ණය නිසි පරිදි නොගෙවීම හේතුවෙන් ඒවා අක්‍රීය ගණයට වැටීම සහ එමගින් මුහුණපෑමට සිදුවන දුෂ්කරතා මගහරවා ගැනිම සඳහා කෙටිකාලීන පිළියමක් ලෙස, ණය සහන කාලයක් හඳුන්වා දෙන ලදී. කෙසේ වෙතත්, මෙම සහන ලබා දෙන කාලය සහ ඒ යටතට ගැනෙන ණය වල වටිනාකම වැඩි වන විට, ණය සහන කාලය තුල මූල්‍ය ආයතන හට තම තැන්පත්කරුවන් හට ගෙවීම් සිදුකිරීමට සහ අනෙකුත් මෙහෙයුම් වියදම් පියවා ගැනීම සඳහා විකල්ප අරමුදල් සපයා ගැනීමට සිදු විය. ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්, මූල්‍ය ආයතනයන් හි අරමුදල්වල පිරිවැය පියවා ගැනීමට ප්‍රමාණවත්, නාමික පොලියක් සහන කාලය සඳහා අය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අවසර ලබා දෙන ලදී. කෙසේ වෙතත්, ඉන් අනතුරුව, මෙම අමතර පොලිය හේතුවෙන් ණය ගනුදෙනුකරුවන් මුහුණ දෙන දුෂ්කරතා සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ණය ගනුදෙනුකරුවන් සහ මූල්‍ය ආයතන යන දෙපාර්ශවයටම පිරිවැය අවම වන යාන්ත්‍රණයක් සහිත උපායමාර්ගයක් හඳුන්වා දීම සඳහා මේ වන විටත් මූලික කටයුතු සිදු කරමින් පවතී.

මෙම අමතර පොලිය සම්බන්ධයෙන් සමාජයේ විවිධ කතිකාවන් ඇති වුවද, එමගින් තැන්පත්කරුවන්ගේ

මුදල් මත අනවශ්‍ය ආතතියක් ඇති නොකරමින් සහ මූල්‍ය ආයතන සහ සමස්ථ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය පවත්වාගනිමින් මාස 18කට වැඩි කාලයක් පුරාවට ණය ගනුදෙනුකරුවන් හට සිය ණය ආපසු ගෙවීම කල් දැමීමට අවස්ථාව ලබා දීම සඳහා මූල්‍ය ආයතන වෙත ඉඩ සැලසෙන ලදී.

**ණය සහන ඉවත් කිරීම: නිසි කල්හි වැදගත්කම**

ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වෙමින් සහ වෙළඳාම් සඳහා රටවල් තම දේශසීමා යළි විවෘත කරමින් පවතින පසුබිමක, ලොව පුරා මහ බැංකු විසින් කොවිඩ්19 ට ප්‍රතිචාර වශයෙන් ගෙන තිබූ සුවිශේෂී ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රමයෙන් ඉවත් කරන ලදී. කෙසේ වෙතත්, ආර්ථිකයේ ද්‍රවශීලතාවය සහ නුබුන්වත්භාවය පවත්වා ගෙන යෑමට හේතුවූ ආධාරක ක්‍රියාමාර්ග නිසි කලට පෙර ඉවත් කිරීමෙන් ආර්ථිකය පුරා පැතිරුණු ණය හිඟයන්, දේපළ සින්න වීම්, බුන්වත් වීම් සහ විරැකියාව ඉහළ යෑම ආදී ප්‍රතිවිපාකයන්ට හේතු විය හැකි බවට විශේෂඥයින් අනතුරු අඟවයි. මෙය පශ්චාත්වසංගත ආර්ථික පුනර්ජීවනයට අහිතකර ලෙස බල පෑ හැකි අතර, මේවායේ ස්වයං හටගැනීමේ (self-reinforcing) ස්වභාවය සහ ප්‍රතිපෝෂණ බලපෑම (feedback effect) නිසා ආර්ථිකයට කෙටිකාලීන සහ දිගු කාලීන බලපෑම් ඇති කල හැක (Financial Stability Board, 2021).

එලෙසම, ආධාරක ක්‍රියාමාර්ග දීර්ඝ කාලයක් පවත්වාගෙන යාමෙන් රටෙහි ණය බර වැඩිවීම, සමාගම් සහ කුටුම්භ විසින් අධික ලෙස අවදානම් ගැනීම, ණය අවදානම වැඩි කිරීම සහ සදාචාරාත්මක අවදානම් (moral hazard) ඇති කිරීමට හේතු විය හැක. එමෙන්ම, දැඩි රාජ්‍ය මූල්‍ය තත්ත්වයන් (tight fiscal positions) පවතින රටවලට මෙම සහන දිගු කාලයක් පවත්වාගෙන යාමේ අධික පිරිවැය දැරීමට අපහසු විය හැක. තවද, මෙමගින් ආර්ථික සම්පත් වඩාත් කාර්යක්ෂම අංශ වෙත ගලා යාම සඳහා දුර්වල/ශක්‍යතාවයෙන් තොර ව්‍යාපාර/ව්‍යාපාර ක්‍රම ආර්ථිකයෙන් ඉවත් වීම සහ තාක්ෂණික වෙනස්වීම් වැනි අත්‍යාවශ්‍ය ආර්ථික ප්‍රතිසංස්කරණයන් මන්දගාමී කිරීමට හේතු විය හැක. (Financial Stability Board, 2021).

**ණය සහනයෙන් ඔබ්බට ඇත්තේ කුමක්ද?**

ණය සහන කාලය සහ අනෙකුත් සහනසාධක ක්‍රියාමාර්ග ඉවත් කිරීම ණය ගැණුම්කරුවන්ට සහ මූල්‍ය ආයතන යන දෙපාර්ශවයන්ටම අභියෝගකාරී වනු ඇත. මෙයට ඉහතින් දක්වා ඇති පරිදි, කොවිඩ්19 වසංගත තත්ත්වය විසින් ව්‍යාපාර ක්ෂේත්‍රයන් ගණනාවකට කර ඇති වෙනස්කම් ස්ථිර ස්වභාවයක් ගන්නා අතර, ඇතැම් ව්‍යාපාරික ආකෘතීන් තවදුරටත් පෙර පරිදිම ලාභදායී නොවිය හැක (Jacobides සහ Reeves, 2020; Morgan, 2020).

ව්‍යාපාර වල අඛණ්ඩතාවය ගැන සලකා බැලීමේදී, මෙම වසංගතය, නිසි ප්‍රාග්ධනයක් නොමැති, හදිසි තත්ත්වයන්ට මුහුණදීම සඳහා සැලසුම් සහ කඩිනම් තීරණ ගැනීමේ හැකියාව නොමැති සමාගම් සඳහා වූ පරීක්ෂාවක් විය. එවැනි ඇතැම් සමාගම් සඳහා, කොවිඩ් වසංගත කාලය තුළ ව්‍යාපාර අඛණ්ඩව පවත්වා ගෙනයාමට හැකිවූ ප්‍රධාන සාධකය ලෙස මෙම සහන ක්‍රියාමාර්ගයන් දැක්විය හැක. එබැවින්, මූල්‍ය ආයතන විසින් ව්‍යාපාර යළි යථා තත්ත්වයට පත්කිරීමට කිරීමට ගන්නා ප්‍රයත්නයන් හිදී ප්‍රමුඛතාවය/අවධානය යොමුකළ යුත්තේ මූල්‍යමය වශයෙන් ශක්‍යතාවයක් ඇති, එහෙත්, සෘජුවම වසංගතය හේතුවෙන් ඇතිවූ ද්‍රවශීලතා සහ බුන්වත් ගැටළු වලින් පීඩා විඳින ව්‍යාපාරයන් වෙතය. එසේම, එවැනි මැදිහත්වීම් නිසි පාරදෘෂ්‍යතාවයකින් සිදු කළයුතු අතර, වෙළඳපොළ තරඟකාරීත්වයට බාධාවක් නොවිය යුතුය (OECD, 2021).

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්, ශක්‍යතාවය සහිත ව්‍යාපාර යළි නගාසිටුවීම සඳහා බලපත්‍රලාභී බැංකු තුළ පශ්චාත් වසංගත ආර්ථික පුනර්ජීවන ඒකක පිහිටුවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත මාර්ගෝපදේශ නිකුත් කළේය.

ඒ අනුව, ණය සහන කාලසීමාව අවසන් කිරීම සඳහා ද්‍රවශීලතා සහාය අවශ්‍ය අය ඇතුළුව, ව්‍යාපාර යළි නගාසිටුවීමට සහාය අවශ්‍ය, ශක්‍යතාවය ඇති ව්‍යාපාර සහිත අක්‍රිය සහ ණය ආපසුගෙවීම් දුර්වල ණය ගනු දෙනු කරුවන් හඳුනාගෙන, ඔවුන් යළි නගාසිටුවීමට අදාළ සැලසුම් සකස්කිරීමට බලපත්‍රලාභී බැංකු විසින් කටයුතු කරනු ඇත.

එවැනි ණය ගැණුම්කරුවන්ට ඔවුන්ගේ පවතින ණය පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීමට/ප්‍රතිලේඛණගත කිරීමට මූල්‍ය සහ මූල්‍ය නොවන පහසුකම් වල සම්මිශ්‍රණයක් ලබා ගත හැකි අතර ඔවුන්ගේ ව්‍යාපාර යළි නගාසිටුවීම සඳහා අවශ්‍යතාව මත පදනම්ව අමතර ණය පහසුකම් සහ/හෝ වෙනත් සුදුසු ආධාරක ක්‍රියාමාර්ග ද ලබා ගත හැකිවනු ඇත.

කෙසේ වෙතත්, හිතාමතා පැහැර හරින ලද ණය ගැතියන් ලෙස හඳුනාගෙන ඇති ගනුදෙනුකරුවන්, ණයට ගත් මුදල් වෙනත් අරමුණු සඳහා යොදාගෙන ඇති ණය පැහැරහරින්නන් සහ ශක්‍යතාවයකින් තොර ව්‍යාපාර හෝ ව්‍යාපෘති සඳහා ණය යොදවා ඇති සහ ව්‍යාපාරයේ වැරදි කළමනාකරණය සහ/හෝ වංචා හේතුවෙන් ණය පැහැර හැර ඇති ගනුදෙනුකරුවන් හට මෙම අවස්ථා හිමි නොවනු ඇත.

**ඉදිරි දැක්ම: තිරසාර, සැමට ප්‍රතිලාභ සැලසෙන ආර්ථික පුනුරුදයක්**

ඉහත සියළු මැදිහත්වීම්වල අවසාන ඉලක්කය වනුයේ ආර්ථිකයට සිදුවන බාධා අවම කර ජනතාවගේ ජීවනෝපායන් යළි යථා තත්ත්වයට පත් කිරීමයි. මේ සඳහා ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන් විසින් වසංගතයෙන් උගත් පාඩම් ගැන සාමූහිකව සිතා බැලිය යුතු අතර, තිරසාර සහ සැමට ප්‍රතිලාභ සැලසෙන පශ්චාත් වසංගත ආර්ථික පුනරුදයක් සුරක්ෂිත කිරීමට සවිඥානික උත්සාහයක් දැරිය යුතුය.

8

ඉදිරි කාලය සැලකීමේදී, මූල්‍ය ආයතන සහ ව්‍යාපාර යන දෙඅංශයම ඔවුන්ගේ ව්‍යාපාර ආකෘතීන් ගැන නැවතත් සිතා බැලිය යුතු අතර, කොවිඩ්19 වසංගතය විසින් නිර්මාණය කරන ලද නව ව්‍යාපාරික අවස්ථා ගවේෂණය කරමින්, ඔවුන්ගේ කාර්යක්ෂමතාව සහ තරඟකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා ව්‍යාපාර ක්‍රියාපටිපාටි සැලසුම් ප්‍රතිනිර්මාණය කළ යුතුය. වැඩිවන අවදානම් තත්ත්වයන් දූරදර්ශීව කළමණාකරණය කරන අතරම, තාක්ෂණික ක්‍රමවේද සඳහා ආයෝජනය කිරීම, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, ඉදිරිකාලයේ දී ප්‍රමුඛතාවය හිමි වන තවත් අංශයකි. මෙහිදී මූල්‍ය ආයතන සහ ව්‍යාපාර ඔවුන්ගේ ණය බර ගැන සැලකිලිමත් වීම වැදගත් අතර, ඔවුන්ගේ නව මුදල් ප්‍රවාහ සහ ආපසු ගෙවීමේ හැකියාවට සරිලන පරිදි සිය ණය පහසුකම් ඒකාබද්ධ කිරීමට, ප්‍රතිව්‍යුහගත කිරීමට හෝ ප්‍රතිලේඛනගත කිරීමට හෝ නුබුන්වත්භාවය පවත්වා ගැනීම සහ එවැනි වර්ධනයක් පවත්වාගෙන යෑම සඳහා අඩු වියදම් අරමුදල් සඳහා විකල්ප මාර්ග සෙවීමට හෝ අභ්‍යන්තරව ප්‍රාග්ධනය ගොඩනැගීම සඳහා යොමු විය යුතු වනු ඇත.

මෙම ක්‍රියාමාර්ගයන්ට සහාය වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය ආයතන හි අභ්‍යන්තර ප්‍රාග්ධන ගොඩනැගීම, ප්‍රතිසාධන සැලසුම් සකස් කිරීම, තාක්ෂණික අවදානම් කළමනාකරණය, දිගුකාලීන අඩු වියදම් අරමුදල් සම්පාදනය සහ මූල්‍ය ආයතනයන් හි අක්‍රීය වත්කම් ක්‍රමානුකූලව බැහැර කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ රැසක් ක්‍රියාත්මක කර ඇත.

මූලාශ්‍ර


- Financial Stability Board. (2021). COVID-19 support measures, Extending, amending and ending. Basel: Financial Stability Board.
- International Monetary Fund. (2022, February 26). Policy Responses to COVID-19. Retrieved from International Monetary Fund: https://www.imf.org/en/Topics/imf-and-covid19/Policy-Responses-to-COVID-19
- Jacobides, M. G., & Reeves, M. (2020, October 30). Adapt Your Business to the New Reality. Retrieved from Havard Business Review: https://hbr.org/2020/09/adapt-your-business-to-the-new-reality
- Morgan, B. (2020, May 01). 10 Examples of How COVID-19 Forced Business Transformation. Retrieved from Forbes: https://www.forbes.com/sites/blakemorgan/2020/05/01/10-examples-of-how-covid-19-forced-business-transformation/?sh=29ac793a1be3
- Nugent, T. (2021, October 14). 5 Ways COVID Has Changed Global Business. Retrieved from Business Because: https://www.businessbecause.com/news/insights/7763/how-covid-has-changed-global-business?sponsored
- OECD. (2021). COVID-19 emergency government support and ensuring a level playing field on the road to recovery. Paris: Organisation for Economic Co-operation and Development.
- Sadun, R., Simcoe, T., & Conti, A. (2021, September 30). Has COVID-19 Permanently Changed Business Strategy? What Experts Say. Retrieved from MIT Sloan Management Review: https://sloanreview.mit.edu/strategy-forum/has-covid-19-permanently-changed-business-strategy-what-experts-say
- The World Bank. (2022). Finance for an Equitable Recovery. Washington, DC: International Bank for Reconstruction and Development / The World Bank.